# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1642/16 - 2010 පෙබරවාරි 25 වැනි බ්‍රහස්පතින්දා - 2010.02.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී.—6/2001.

**2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත**

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 80 වැනි වගන්තියේ 80 (1) වැනි උප වගන්තියේ (ආ) සහ (ඇ) ඡේද, 86 වන වගන්තිය සහ 94 වැනි වගන්තිය සමග කියවෙන එකී පනතේ 105 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් සාදනු ලබන රීති.

උදයශ්‍රී කාරියවසම්,
සභාපති,
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය.

2010 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ,
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ දී ය.

රීති

2005 සැප්තැම්බර් මස 29 වැනි දින සහ අංක 1412/30 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ, 2005 ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩල රීති පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

1. එහි 7 වැනි රීතිය වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන් :—

"7. සෑම තැරැව්කරුවකු විසින්ම, 2010 අප්‍රේල් මස 01 වැනි දින සිට ආරම්භ වන සෑම කාර්තුවක්ම සඳහා, එකී කාර්තුව අවසන් වූ දින සිට දින හතලිස් පහක් ඇතුළත, මෙහි රීතිවල පළමුවන උපලේඛනයේ දක්වා ඇති පරිදි වූ උපදෙස්වලට අනුකූලව එහි කාර්තු වාර්තා ඉදිරිපත් කළ යුතු ය.

2. (අ) 8 (1) (අ) රීතිවල "සමාන ශාස්ත්‍රීය හෝ වෘත්තීය සුදුසුකම්" යන වචන වෙනුවට, "ශාස්ත්‍රීය හෝ වෘත්තීය සුදුසුකමක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) 8 (2) රීතියෙහි, (ආ) අනු රීතිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අනු රීතිය ආදේශ කිරීමෙන් :—

"(ආ) (i) ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් හෝ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අන්‍ය වූ ආයතනයක් විසින් හෝ පවත්වනු ලබන තැරැව්කරුවන් සඳහා සහතික ලබාදීමේ පරීක්ෂණය සමත් විය යුතු ය ;

(ii) මූල්‍ය කළමනාකරණය සම්බන්ධව කරනු ලැබූ වරදක් සඳහා හෝ චරිත දූෂණය හා සම්බන්ධ යම් වරදක් සඳහා හෝ, ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක නිසි අධිකරණයක් මගින් වරදකරු නොකරනු ලැබ තිබිය යුතු ය ;

(iii) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක යම් නීතියක් යටතේ නිදහස් නොකරනු ලැබූ වස්තු භංගත්වයට පත්වූවකු ලෙස හෝ බංකොලොත්භාවයට පත්වූවකු ලෙස හෝ ප්‍රකාශිත නොකරනු ලැබ තිබිය යුතු ය ;

(iv) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක නිසි අධිකරණයක් මගින්, සිහිවිකල පුද්ගලයකු ලෙස ප්‍රකාශිත නොකරනු ලැබ තිබිය යුතු ය ;

(v) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක නිසි අධිකරණයක් මගින් ණයක් නැවත ගෙවීමට අදාළව දෙනු ලැබූ යම් තීන්දුවක් හෝ නියෝගයක් ඉටු කිරීමට අපොහොසත් වූවකු නොවිය යුතු ය ;

(vi) නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක නියෝගයක් මගින්, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් රක්ෂණ සමාගමක, රක්ෂණ තැරැව්කරුවකු සමග බැංකුවක, මූල්‍ය ආයතනයක, හෝ සංස්ථාපිත මණ්ඩලයක ප්‍රධාන විධායක නිලධරයකු, අධ්‍යක්ෂවරයකු හෝ අධිකාරි බලය සහිත වෙනත් ධූරයක හෝ සේවය කිරීමෙන් ඉවත් කොට හෝ එසේ සේවය කිරීම අත්හිටවනු ලැබ හෝ නොතිබිය යුතු ය ; සහ

(vii) *ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත*—

(අ) රක්ෂණ සමාගමක් හෝ රක්ෂණ තැරැව්කරුවකු හෝ බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් හෝ ලෙස ක්‍රියාකිරීම සඳහා ප්‍රදානය කරනු ලැබූ බලපත්‍රයක් හෝ වෙනත් අධිකාරයක් අත්හිටවනු ලැබූ හෝ අවලංගු කරනු ලැබූ හෝ ප්‍රතික්ෂේප කරනු ලැබූ ; නැතහොත්

(ආ) ගණන් බේරා වසාදමනු ලැබූ හෝ ගණන් බේරා වසා දැමීම සිදුවෙමින් පවතින නැතහොත් අනිවාර්යය ඈවර කිරීම සිදුවෙමින් පවතින,

යම් රක්ෂණ සමාගමක, රක්ෂණ තැරැව්කරුවකු වෙත, බැංකුවක, මූල්‍ය ආයතනයක හෝ සංස්ථාපිත මණ්ඩලයක ප්‍රධාන විධායක නිලධරයකු, අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන නිලධරයකු, විශේෂිත නිලධරයකු හෝ වෙනත් යම් අධිකාරි බලය සහිත නිලධරයකු නොවිය යුතු ය."

3. එහි 10 වැනි රීතියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් රීතිය ආදේශ කිරීමෙන් :—

"11. පනතේ 80 වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් තැනැත්තකුගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු :—

(1) ශාස්ත්‍රීය හෝ වෘත්තීමය සුදුසුකම් හෝ රක්ෂණ, මූල්‍ය, ව්‍යාපාරික හෝ වෙනත් යම් අදාළ අධ්‍යයන ක්ෂේත්‍රයක ඵලදායී පළපුරුද්ද නොමැති නම් ;

(2) මූල්‍ය කළමනාකරණය හෝ චරිත දූෂණය හා සම්බන්ධ යම් වරදක් හෝ සම්බන්ධයෙන් සිදුකරන ලද අපරාධයකට, ශ්‍රී ලංකාවේ හෝ යම් වෙනත් රටක නිසි අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබ ඇත්නම් ;

(3) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක නීතියක් යටතේ, නිදහස් නොකළ වස්තු භංගත්වයට හෝ බංකොලොත්භාවයට හෝ පත්වූවකු ලෙස ප්‍රකාශ කරනු ලැබ ඇත්නම් ;

(4) යම් ණයක් නැවත ගෙවීමක් හා සම්බන්ධව ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක නිසි අධිකරණයක් මගින් දෙන ලද තීන්දුවක් හෝ නියෝගයක් ඉටුකිරීමට අපොහොසත් වූවකු නම් ;

(5) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක නිසි අධිකරණයක් මගින් සිහිවිකල තැනැත්තකු ලෙස ප්‍රකාශ කරනු ලැබ ඇත්නම් ;

(6) යම් නියාමන හෝ අධීක්ෂණ අධිකාරයක නියෝගයක් මගින් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත, යම් රක්ෂණ සමාගමක, රක්ෂණ තැරැව්කරුවකු වෙත, බැංකුවක, මූල්‍ය ආයතනයක හෝ සංස්ථාපිත මණ්ඩලයක ප්‍රධාන විධායක නිලධරයකු, අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් යම් අධිකාරි බලය ඇති ධූරයක හෝ සේවය කිරීමෙන් ඉවත් කරනු ලැබ හෝ එසේ සේවය කිරීම අත්හිටවනු ලැබ හෝ ඇත්තේ නම් ; හෝ

(7) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත —

(අ) යම් රක්ෂණ සමාගමක් හෝ රක්ෂණ තැරැව්කරුවකු හෝ බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් හෝ ලෙස ක්‍රියා කිරීම සඳහා ප්‍රදානය කරනු ලැබූ බලපත්‍රයක් හෝ වෙනත් අධිකාරියක්, අත්හිටවනු ලැබූ හෝ අවලංගු කරනු ලැබූ හෝ ප්‍රතික්ෂේප කරනු ලැබූ ; නැතහොත්

(ආ) ගණන් බේරා වසා දමනු ලැබූ හෝ ගණන් බේරා වසා දැමීම සිදුවෙමින් පවතින නැතහොත් අනිවාර්යය ඈවර කිරීම සිදුවෙමින් පවතින ;

යම් රක්ෂණ සමාගමක, රක්ෂණ තැරැව්කරුවකු වෙත, බැංකුවක, මූල්‍ය ආයතනයක හෝ සංස්ථාපිත මණ්ඩලයක ප්‍රධාන විධායක නිලධරයකු අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන නිලධරයකු, විශේෂිත නිලධරයකු හෝ වෙනත් යම් අධිකාරී බලය සහිත නිලධරයකු වූ තැනැත්තෙක් වන්නේ නම්,

එකී තැනැත්තා රක්ෂණ තැරැව්කරුවකු ලෙස ලියාපදිංචි කරනු ලැබීමට සුදුස්සකු නොවන්නේ ය. ”

4. එහි 11 වැනි රීතිය එහි 12 වැනි රීතිය ලෙස නැවත අංක යෙදීමෙන්.

5. නැවත අංක යෙදූ 12 වැනි රීතියෙහි, “ මණ්ඩලය” යන පදයෙහි නිර්වචනයට ඉක්බිතිවම පහත දැක්වෙන නිර්වචනය ඇතුළත් කිරීමෙන් —

“තැනැත්තා” යන්නට සංස්ථාපිත වූ හෝ සංස්ථාපිත නොවූ මණ්ඩලයක් ද ඇතුළත් වේ.

6. එකී රීතිවල පළමුවැනි උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :—

**පළමුවැනි උපලේඛනය**

***I වැනි කොටස***

තැරැව්කරුවන්ගේ කාර්තු වාර්තා සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

1. සෑම තැරැව්කරුවකු විසින් ම, යම් කාර්තුවක් අවසන් වූ දින සිට දින හතලිස් පහක් ඇතුළත පහත දක්වා ඇති තොරතුරු මණ්ඩලට ඉදිරිපත් කළ යුතු ය :—

(අ) 1 වැනි ආකෘතිය - රක්ෂණ වාරික ආදායම සහ කොමිස් මුදල් ආදායම පිළිබඳ විස්තර

(ආ) 2 වැනි ආකෘතිය - ස්ථානගත කිරීමේ විස්තර

(ඇ) 3 වැනි ආකෘතිය - රක්ෂණ තැරැව්කාර ගිණුම් පිළිබඳ විස්තර

(ඈ) 4 වැනි ආකෘතිය - රක්ෂණ තැරැව්කරුවන් විසින් අයකොට ගනු ලැබූ සහ රක්ෂණ සමාගම්වලට ගෙවීම සඳහා පවතින රක්ෂණ වාරික පිළිබඳ විස්තර

(ඉ) 5 වැනි ආකෘතිය - ආදායම් ප්‍රකාශය

(ඊ) 6 වැනි ආකෘතිය - ශේෂ පත්‍රය

(උ) 7 වැනි ආකෘතිය - හිමිකරු ප්‍රාග්ධනය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2. මූල්‍ය ප්‍රකාශ, ගිණුම්කරණයට අදාළ වූ උපචිතවීමේ පදනම මත සකස් කළ යුතු ය. මෙකී පදනම යටතේ ගනුදෙනුවේ බලපෑම සහ වෙනත් සිද්ධිවල බලපෑම ඒවා සිදුවන අවස්ථාව මත හඳුනාගනු ලැබේ. (මුදල් හෝ මුදල් සාම්‍ය ලැබීමේ දී හෝ ගෙවීමේ දී නොවේ.) තව ද ඒවා ගිණුම් වාර්තාවල සටහන්ගත කොට, ඒවා අදාළ වන්නා වූ කාලය සඳහා වන මූල්‍ය ප්‍රකාශවල වාර්තා කරනු ලැබේ.

3. *කාර්තුවක් යන්න පහත දක්වා ඇති පරිදි සංයුක්ත වේ :—*

(අ) 1 වැනි කාර්තුව - ජනවාරි මස 1 වැනි දින සිට මාර්තු මස 31 වැනි දින දක්වා

(ආ) 2 වැනි කාර්තුව - අප්‍රේල් මස 1 වැනි දින සිට ජූනි මස 30 වැනි දින දක්වා

(ඇ) 3 වැනි කාර්තුව - ජූලි මස 1 වැනි දින සිට සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා

(ඈ) 4 වැනි කාර්තුව - ඔක්තෝබර් මස 1 වැනි දින සිට දෙසැම්බර් මස 31 වැනි දින දක්වා

පළමුවැනි උපලේඛනය

II වැනි කොටස

*තැරැව්කරුවන්ගේ කාර්තු වාර්තා*

තැරැව්කරුගේ නම :
අවසන් වූ කාර්තුව :

1 වැනි ආකෘතිය : රක්ෂණ වාරික ආදායම සහ කොමිස් මුදල් ආදායම් පිළිබඳ තොරතුරු

| *(1)* *රක්ෂණ ව්‍යාපාර පංතිය* | *(2)* *වාරික ආදායම (රුපියල්)* | *(3)* *වාරික ආදායම මුළු වාරික ආදායමේ ප්‍රතිශතයක් ලෙස* | *(4)* *කොමිස් ආදායම (රුපියල්)* | *(5)* *කොමිස් ආදායම වාරික ආදායමේ ප්‍රතිශතයක් ලෙස* | *(6)* *රක්ෂණ නියෝජිතයන්ගේ කොමිස් මුදල් (රුපියල්)* | *(7)* *තැරැව්කරු ලබන ශුද්ධ කොමිස් මුදල් (රුපියල්)* |
|---|---|---|---|---|---|---|
| (අ) ජීවිත රක්ෂණ | | | | | | |
| තනි පුද්ගල | | | | | | |
| කණ්ඩායම් ව්‍යාපාර | | | | | | |
| වෙනත් | | | | | | |
| මුළු ගණන (අ) | | | | | | |
| | | | | | | |
| (ආ) සාමාන්‍ය රක්ෂණ | | | | | | |
| ගිනි | | | | | | |
| සමුද්‍රීය | | | | | | |
| මෝටර් වාහන | | | | | | |
| විවිධ | | | | | | |
| සේවා යෝජකයාගේ වගකීම | | | | | | |
| වෙනත් | | | | | | |
| මුළු එකතුව (ආ) | | | | | | |
| මුළු එකතුව (අ + ආ) | | | | | | |

:

මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබූ ඉහත දැක්වෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මම සහතික කරමි.

ප්‍රධාන නිලධරයාගේ නම සහ අත්සන :...................................

දිනය : ...................................

*පැහැදිලි කිරීමේ සටහන්* :

(*අ*) 2 වැනි තීරුව - අදාළ කාර්තුව සඳහා තැරැව්කරු විසින් ගනුදෙනු කරනු ලැබූ මුළු වාරික වෙන්ව පෙන්වීම.

(ආ) 2 වැනි තීරුව යටතේ වාරික ආදායම් පිළිබඳ විස්තර සපයනු ලැබුවේ යම් අයිතමයන් සම්බන්ධයෙන් ද, එකී අයිතමයන් සඳහා 3 වැනි තීරුව යටතේ තොරතුරු සැපයිය යුතු ය.

(*ඇ*) කොමිස් මුදල් ආදායම වාරික ආදායමේ ප්‍රතිශතක් ලෙස 5 වැනි තීරුවේ එක් එක් පේළියේ දැක්විය යුතු ය. උදාහරණයන් ලෙස 5 වැනි තීරුවේ ගිනි රක්ෂණ ව්‍යාපාරය යටතේ වූ කොමිස් මුදල, ගිනි ආරක්ෂණ සඳහා වූ වාරික ආදායමේ ප්‍රතිශතයක් ලෙස දක්වා තිබේ.

**_2 වැනි ආකෘතිය_ : ස්ථානගත කිරීමේ විස්තර**

| රක්ෂණකරුගේ නම | ජීවිත රක්ෂණ වාරික ආදායම | | | සාමාන්‍ය රක්ෂණ වාරික ආදායම | | | | | | මුළු වාරික ආදායම (රුපියල්) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | තනි පුද්ගල (රුපියල්) | කණ්ඩායම් (රුපියල්) | වෙනත් (රුපියල්) | ගිනි (රුපියල්) | සමුද්‍රීය (රුපියල්) | මෝටර් වාහන (රුපියල්) | විවිධ (රුපියල්) | සේවා යෝජක වගකීම (රුපියල්) | වෙනත් (රුපියල්) | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| මුළු මුදල | | | | | | | | | | |

මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබූ ඉහත දැක්වෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මම සහතික කරමි.

ප්‍රධාන නිලධරයාගේ නම සහ අත්සන : ………………………………,

දිනය :…………………,

*පැහැදිලි කිරීමේ සටහන්*

එක්, එක් පංතිය / උප පංතියට අදාළ රක්ෂණ ව්‍යාපාර තොරතුරු සෑම රක්ෂණ කරුවෙකුටම අදාළව වෙන වෙනම ඉදිරිපත් කළ යුතු වන අතර ඒවායේ සටහන්ගත මුළු එකතුව 1 වැනි ආකෘතියේ 2 වැනි තීරුවේ දක්වා ඇති මුළු එකතුව හා සමග එකඟ විය යුතු ය.

**_3 වැනි ආකෘතිය_ : රක්ෂණ තැරැව්කාර ගිණුමේ/ගිණුම්වල විස්තර :**

බැංකුවේ නම/නම් : ………………………………,

ගිණුමේ නම/නම් : ………………………………,

ගිණුම් අංකය / අංක : ………………………………,

| | පවත්නා කාර්තුව (රුපියල් ) | පෙර කාර්තුව (රුපියල්) |
|---|---|---|
| කාර්තුව ආරම්භයේ දී ඉදිරියට ගෙන ආ ශේෂය | | |
| අයකොට තැන්පත් කරනු ලැබූ රක්ෂණ වාරිකය | | |
| රක්ෂණකරුවන්ට ප්‍රේෂණය කරනු ලැබූ රක්ෂණ වාරික | | |
| කාර්තුව අවසානයේ ඉදිරියට රැගෙන යනු ලැබූ ශේෂය | | |

මණ්ඩලයට සපයන ලද ඉහත දැක්වෙන තොරතුරු සත්‍ය සහ නිවැරැදි බවට සහතික කරමි.

ප්‍රධාන නිලධාරයාගේ නම සහ අත්සන : ..................

දිනය : ..................

***පැහැදිලි කිරීමේ සටහන් :***

(අ) රක්ෂණ ඔප්පු හිමිකරුවන් සම්බන්ධයෙන් වූ ලැබීම් සහ ගෙවීම්වල කාර්යය සඳහා, බලපත්‍රලාභී වාණිජ බැංකුවක්/ බැංකු සමග පවත්වාගෙන යන ගිණුම්/ ගිණුම සම්බන්ධයෙන්, රක්ෂණ තැරැව්කාර ගිණුම් පිළිබඳ විස්තර ඉදිරිපත් කළ යුතු ය.

(ආ) එකකට වැඩි තැරැව්කාර ගිණුම් පවත්වාගෙන යන්නේ නම්, ඉහත සඳහන් තොරතුරු වෙන් වෙන්ව දැක්විය යුතු ය.

(ඇ) **පවත්නා කාර්තුව** - 1 වැනි, 2 වැනි, 3 වැනි හෝ 4 වැනි කාර්තු වශයෙන් සලකුණු ලබන, යම් දෙන ලද කාර්තුවක් සඳහා වූ වාර්තා කාලය

(ඈ) **පෙර කාර්තුව** - පෙර කාර්තුවට අදාළ තොරතුරු

**4 වැනි ආකෘතිය :** *රක්ෂණ තැරැව්කරුවන් විසින් එකතු කරනු ලැබූ සහ රක්ෂණ සමාගම්වලට ප්‍රේෂණය කිරීම සඳහා පවත්නා රක්ෂණ වාරික පිළිබඳ විස්තර*

| *(1)* *රක්ෂණකරුගේ නම* | *(2)* *එකතු කරනු ලැබූ සහ රක්ෂණකරුවන්ට ගෙවිය යුතු වූ මුළු රක්ෂණ වාරික මුදල (රුපියල්)* | *(3)* *සති දෙකක අය කිරීම්වලට වඩා අඩු වූ ද, රක්ෂණකරුවන්ට ගෙවිය යුතු වූ ද, මුළු රක්ෂණ වාරික මුදල (රුපියල්)* | *(4)* *සති දෙකක අය කිරීම් ඉක්ම වූ ද, රක්ෂණකරුවන්ට ගෙවිය යුතු වූ ද, මුළු රක්ෂණ වාරික මුදල (රුපියල්)* | *(5)* *සති දෙකක අයකිරීම් එකතු කර ගැනීමෙන් පසු රක්ෂණ වාරික ප්‍රේෂණය නොකිරීමට හේතු* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| මුළු මුදල | | | | |

මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබූ ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මම සහතික කරමි.

ප්‍රධාන නිලධාරයාගේ නම සහ අත්සන : ..........................

දිනය : ..........................

*පැහැදිලි කිරීමේ සටහන්* :

(අ) 2 වැනි තීරුවේ සඳහන් කොට ඇති මුළු රක්ෂණ වාරිකය, 3 වැනි සහ 4 වැනි තීරුවේ සඳහන් කොට ඇති මුළු රක්ෂණ වාරිකවලට සමාන විය යුතු ය.

(ආ) 2 වැනි තීරුවේ මුළු මුදල, සමාගමේ ශේෂ පත්‍රයෙහි දිනය වන විට රක්ෂණ සමාගම්වලට ගෙවිය යුතු ලෙස ශේෂ පත්‍රයෙහි දක්වා තිබෙන, (ගෙවිය යුතු වාරික ) රක්ෂණ තැරැව්කරුවන්ට ලැබුණු සහ නොගෙවූ වාරිකවල අගයට සමාන විය යුතු ය.

**5 වැනි ආකෘතිය** : *ආදායම් ප්‍රකාශය*

*අවසන් වූ කර්තුව සඳහා* :

| *(1)* | *(2)* *පවත්නා කාර්තුව (රුපියල්)* | *(3)* *කාල පරිච්ඡේදය සඳහා සමුච්චිතය (රුපියල්)* |
|---|---|---|
| *ආදායම්* | | |
| කොමිස් ආදායම් | | |
| වෙනත් ආදායම් | | |
| මුළු ආදායම් | | |
| *අඩු කළා* : පරිපාලන වියදම් | | |
| විකුණුම් සහ බෙදා හැරීම් වියදම් | | |
| මුල්‍ය වියදම් | | |
| වෙනත් වියදම් | | |
| බදු අය කිරීමට පෙර ලාභය | | |
| බදු අය කිරීම් | | |
| බදු අය කිරීමෙන් පසු ශුද්ධ ලාභය/(පාඩුව ) | | |

අපගේ උපරිම දැනීම අනුව නිවැරදි බවට සහතික කරමු.

නම : …………………… ........................................

අත්සන : …………………… ........................................

ප්‍රධාන නිලධරයා අධ්‍යක්ෂ

දිනය : ……………………

*පැහැදිලි කිරීමේ සටහන්* :

(අ) 2 වැනි තීරුව : පවත්නා කාර්තුව යනු, කාර්තු වාර්තා ඉදිරිපත් කරනු ලැබූ කාර්තුවයි.

(ආ) 3 වැනි තීරුව : කාල පරිච්ඡේදය සඳහා සමුච්චිත අගය — එනම්, 2 වැනි කාර්තුව සඳහා කාර්තු වාර්තා ඉදිරිපත් කළේ නම්, එහි කාල පරිච්ඡේදය සඳහා සමුච්චිත අගය වනුයේ ජනාවරි මස 1 වැනි දින සිට ජුනි මස 30 වැනි දින දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා වූ අගය යි.

6 වන ආකෘතිය :.................................. දිනට ශේෂ පත්‍රය

| | පවත්නා කාර්තුව (රුපියල් ) | පූර්ව කාර්තුව (රුපියල් ) |
|---|---|---|
| **වත්කම් :** | | |
| ජංගම නොවන වත්කම් | | |
| දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ | | |
| දීර්ඝ කාලීන ආයෝජන | | |
| වෙනත් | | |
| **ජංගම වත්කම් :** | | |
| ලැබිය යුතු කොමිස් මුදල් | | |
| කලින් ගෙවීම් සහ වෙනත් අයවිය යුතු මුදල් | | |
| කෙටි කාලීන ආයෝජන | | |
| වෙනත් ජංගම වත්කම් | | |
| මුදල් සහ මුදල් සාමාන්‍යයන් : | | |
| රක්ෂණ තැරැව්කරු ගිණුම/ගිණුම් | | |
| වෙනත් | | |
| **මුළු වත්කම්** | | |
| **හිමිකරු ප්‍රාග්ධනය හා වගකීම් :** | | |
| හිමිකරු ප්‍රග්ධනය | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | |
| සාමාන්‍ය සංචිත | | |
| රඳවාගත් ඉපැයීම් | | |
| වෙනත් | | |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය** | | |
| **ජංගම නොවන බැරකම් :** | | |
| පොලී දරන ණය ගැනුම් සහ ණයට ලබාගත් මුදල් | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් | | |
| **ජංගම බැරකම් :** | | |
| ගෙවිය යුතු වාරික මුදල් | | |
| ගෙවිය යුතු නියෝජිත කොමිස් මුදල් | | |
| විවිධ වියදම් හා උපචිත ගෙවීම් | | |
| ගෙවිය යුතු ආදායම් බදු | | |
| පොලී දරණ ණය ගැනුම් සහ ණයට ලබාගත් මුදල් | | |
| කෙටි කාලීනව ලබාගත් ණය | | |
| වෙනත් | | |
| **මුළු බැරකම්** | | |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය හා බැරකම්** | | |

අපගේ උපරිම දැනීම අනුව නිවැරදි බවට සහතික කරමු.

නම : ……………………

අත්සන : …………………

ප්‍රධාන නිලධරයා                    අධ්‍යක්ෂ

දිනය : …………………

***පැහැදිළි කිරීමේ සටහන් :***

*ශේෂ පත්‍රය පහත දැක්වෙන පරිදි පිළියෙළ කළ යුතු ය :—*

(අ) රක්ෂණ ඔප්පු හිමියන්ගෙන් අයකොට, රක්ෂණ සමාගම්වලට ගෙවිය යුතු රක්ෂණ වාරික, ශේෂ පත්‍රයේ ජංගම වත්කම් යටතේ, ලැබීමට ඇති දේ වශයෙන් හෝ ණයකරුවන් වශයෙන් හෝ නොදැක්විය යුතු ය.

(ආ) එලෙසම රක්ෂණ ඔප්පු සම්බන්ධයෙන් රක්ෂණ ඔප්පු හිමියන් විසින් තවමත් නොගෙවන ලද සහ රක්ෂණ සමාගම්වලට ගෙවිය යුතු රක්ෂණ වාරික, ශේෂ පත්‍රයේ ජංගම බැරකම් යටතේ ගෙවිය යුතු දේ ලෙස හෝ ණය හිමියන් ලෙස හෝ නොදැක්විය යුතු ය.

(ඇ) කෙසේ වුව ද, රක්ෂණ ඔප්පු හිමියන්ගෙන් අයකොට ගන්නා ලදුව රක්ෂණ සමාගම්වලට ප්‍රේෂණය කිරීම සඳහා පවතින රක්ෂණ වාරික, ශේෂ පත්‍රයේ ගෙවිය යුතු වාරික ලෙස ජංගම බැරකම් යටතේ දැක්විය යුතු ය. තව ද, එය 4 වැනි ආකෘතියේ 2 වන තීරුවේ (ගෙවිය යුතු වාරික ) එදිනට පවතින මුළු ගණන හා එකග විය යුතු ය.

(ඈ) **පවත්නා කාර්තුව** - 1 වැනි, 2 වැනි, 3 වැනි හෝ 4 වැනි කාර්තු ලෙස සලකනු ලබන යම් දෙන ලද කාර්තුවක් අවසානයේ වූ වාර්තා කාලය.

(ඉ) **පසුගිය කාර්තුව** - පසුගිය කාර්තුවේ අවසානයට අදාළ වූ දත්ත.

**ආකෘතිය** - 7 : හිමිකම් ප්‍රාග්ධනය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

*අවසන් කාර්තුව සඳහා :*

| | *කොටස් ප්‍රාග්ධනය (රුපියල්)* | *පොදු සංචිත (රුපියල්)* | *රඳවාගත් ඉපැයුම් (රුපියල්)* | *වෙනත් සංචිත (රුපියල්)* | *මුළු මුදල (රුපියල්)* |
|---|---|---|---|---|---|
| ..................... දින වන විට ශේෂය (පූර්ව කාර්තුව ආරම්භය)<br>එකතු කරන්න — කාර්තුව සඳහා වූ ශුද්ධ ලාභය<br>පොදු සංචිතයට මාරු කිරීම්<br>අඩු කරන්න — ගෙවන ලද ලාභාංශ | | | | | |
| ............... දිනට ශේෂය (පෙර කාර්තුව අවසානය ) | | | | | |
| **එකතු කළා** : පවත්නා කාර්තුව සඳහා වූ ශුද්ධ ලාභය<br>පොදු සංචිතයට මාරු කිරීම්<br>**අඩු කළා** — ගෙවන ලද ලාබාංශ | | | | | |
| ........................ දිනට ශේෂය (පවත්නා කාර්තුව අවසානයේ) | | | | | |

අපගේ උපරිම දැනීම අනුව නිවැරදි බවට සහතික කරමු.

නම : .........................................   ................................

අත්සන :....................................   ..................................

ප්‍රධාන නිලධරයා                    අධ්‍යක්ෂ

දිනය : ...............................

03—416

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.